## අවසාන වාර පරීක්ෂණය - www.eduLanka.LK

9 ශ්‍රේණිය සිංහල 1 කොටස

1. මාතෘ භූමියට තවත් යෙදුමකි
   1 ) දේශාභිමානය 2 ) වාත්සල්‍යය 3 ) නිජ භූමිය 4 ) ශ්‍රී විභූතිය
2. ලංකා ලංකා පෙම්බර ලංකා ........... යන දේශාභිමානී ගීතය රචනා කළේ
   1 ) අරිසෙන් අහුබුදු 2 ) ඩෝල්ටන් අල්විස් 3 ) මහගම සේකර 4 ) චිත්‍රානන්ද අබේසේකර
3. අභිමානය යනු
   1 ) ගෞරවය 2 ) අලංකාරය 3 ) විශ්වාසය 4 ) සාඩම්බර හැඟීම
4. මව් සෙනේ ගුවන් විදුලි නාට්‍යය රචනා කලේ
   1 ) මහගම සේකර 2 ) චිත්‍රානන්ද අබේසේකර 3 ) කරුණාරත්න අමරසිංහ 4 ) ඩබ්ලිව් ඒ සිල්වා
5. පරිකල්පනය යනු
   1) සිතින් මවා ගැනීම 2) ගොඩ නැගීම 3) එඩිතරකම ) ආසන්න වීම
6. කජ්ජක් යනු
   1) දක්ෂකමක් 2) පහසු කාර්යයක් 3) විනෝදයක් 4) නිර්මාණයක්
7. සෝමවීර සේනානායක මහතා ලියූ රසවත් කෙටිකතාවකි
   1) නෙළුම් දෙනියෙන් පිපුණු නෙළුම 2) විශ්‍රාම ගිය මුල් ගුරුතුමා
   3) රණබිම අබියස 4) මාවත
8. ආකර්ෂණීය යනු
   1) කනට මිහිරි 2) බිය සුළු 3) සිත් ඇදගන්න 4) විනෝදකාමී
9. පුවත්පතක තිබියයුතු අනිවාර්ය අංගයකි
   1) පාඨකයාගේ සිත් ඇද බැඳ ගන්නා කරුණු 2) වර්ණගත රූප
   3) දෙබස් 4) ගමන් විස්තර
10. "ඇලි, මැලි" යන වචනයට සමාන පදයක් නම්
    1) අදි මදි 2) ආවා ගියා 3) වග තුග 4) දුක සැප
11. ඉහත්තාව යනු
    1) සැනසුම 2) ඉස්මත්ත 3) අන්ධකාරය 4) බැද්ද
12. "ශබ්ද මාධුර්යය" යනු
    1) ශබ්දයේ මිහිරි බව 2) ශබ්දයේ කටුක බව 3) අර්ථ රසය වැඩි බව 4) ගැළපීම
13. "කුරුලු පාලිව" කුමන ග්‍රන්ථයක් ඇසුරින් සකස් කරන ලද්දක්ද?
    1) සාගර පත්ල 2) වටපිළ 3) පාලි අද්දර 4) වෙස්සන්තර
14. ගිරා සන්දේශය ලියවුනේ
    1) අනුරාධපුර යුගයේදී 2) පොලොන්නරු යුගයේ 3) කෝට්ටේ යුගයේදී 4) මහනුවර යුගයේදී
15. සමාසයක් යනු
    1) රසවත් භාෂා රීතියකි 2) පද කීපයක් එක්වීමෙන් සෑදීමේ ඒකකය
    3) පද බෙදා වෙන් කිරීමකි 4) තොරතුරු හුවමාරු කිරීමකි
16. මුහුදු පතුල යට ඉඳලා ....... ගීතය පද රචනා කළේ
    1) W.A. සිල්වා 2) මහගම සේකර 3) අමරසේකර 4) සුනිල් ආරියරත්න
17. නාම විශේෂණයකි
    1) පුංචි කුඩුව 2) කාර්යයන් 3) සතුටින් කල් ගෙව්වා 4) පරිශීලනය

18. ඩබ්ලිව්. ඒ. සිල්වා ශූරීන්ගේ නවකථාවකි

   1) විශ්‍රාම ගිය මුල් ගුරුතුමා 2) අලිබබා සහ හොරු හතලිහ 3) විජයබා කොල්ලය 4) කලියුගය

19. කන්නයක් වගා කිරීම සඳහා මංගල දියවර හැරවීම මෙනමින් ව්‍යවහාර වේ.

   1) මුත්තෙට්ටුව 2) වප්පැන 3) පින්බර 4) පුරන් හීය

20. අයියනායක පද්‍ය පන්තිය රචනා කොට ඇත්තේ

   1) කෝට්ටේ යුගයේදී 2) මහනුවර යුගයේදී 3) පොළොන්නරු යුගයේදී 4) කොළඹ යුගයේදී

www.eduLanka.LK

අවසාන වාර පරීක්ෂණය

9 ශ්‍රේණිය සිංහල 11 කොටස

1. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
    1) පහත දැක්වෙන අකුරු ඇතුලත් කොට අර්ථවත් වචන 2 බැගින් ලියන්න.
    (අ) ණ (ආ) ළ
    2) පහග දැක්වෙන යුගල පද සම්පූර්ණ කරන්න.
    (අ) ................. බාන (ආ) ................. සිදුරු
    3) පහත සඳහන් ක්‍රියා පද වලට උදාහරණය බැලින් දක්වන්න.
    (අ) අසම්භාව්‍ය ක්‍රියා (2) මිශ්‍ර ක්‍රියා
    4) පහත දැක්වෙන ප්‍රාදේශීය ව්‍යවහාර වල පොදු ව්‍යවහාරය ලියන්න.
    (අ) වසත්තු කිරීම (2) සෝමාරියා
    5) පහත දැක්වෙන ප්‍රස්ථාව පිරුළු සම්පූර්ණ කරන්න.
    (අ) වක්කඩේ ..................... (2) කළුවා .....................

2. පහත සඳහන් කවිය කියවා අසාඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

පන්සිල් වීණා නද පසු බැස්වූ
මන් පිණවන වෙණ නදයෙන් තොස්වූ
නන් දන කැන් දුටුවද බිය සිස්වූ
මින් රළ වුත් ගං වෙරළට රැස්වූ

    1) මෙහි පන්සිල් යනුවෙන් හඳුන්වන්නේ කවුද?
    2) මෙහි සඳහන් මින් රළ රැස්වූයේ කිනම් ස්ථානයකටද?
    3) වීණා නාදයේ මිහිරි බව මතුකර පෙන්වීමට කවියා යොදා ගත් උපක්‍රම මොනවාද?
    4) ගුත්තිල කාව්‍යය රචනා කළේ කවුද?
    5) ඔහි සඳහන් පද්‍ය සංඛ්‍යාව කීයද?

3. අපේ රටට මහත් ව්‍යසනයක් වී ඇති ඩෙංගු රෝගය දැන් ලංකාවට මහත් ගැටළුවක් වී ඇත. අප ඉවතලන ඉටි පොලිතීන් මලු එමෙන්ම හිස් යෝගට් කප් පොල් කටු ආදිය විනාශ කර දමා මේ විනාශකාරී රෝගයෙන් මිදීමට අපිත් දායක වීමට උත්සාහ ගනිමු.

- සුදුසු මාතෘකාවක් යොදා වචන 150ට නොඅඩු රචනාවක් ලියන්න.

4.
    1) මෙහි අවස්ථා සම්බන්ධය ලියන්න.
    මේ ටික කලින් හිතුවනම් හොඳා. දැන් උඹලා මගේ ස්වාමියා. කොයි රජෙකුටත් වැඩිය මට මගේ ස්වාමියා ලොකුය.
    2) මෙය කවුරුන් විසින් කා හට කියන ලද්දක්ද?
    3) මෙය කුමන පාඩමෙන් උපුටා ගත්තේද?
    4) මෙසේ කීමට හේතුව කුමක්ද?
    5) මේ පාඩමෙන් ඔබට ගතහැකි ආදර්ශය කුමක්ද?


www.eduLanka.LK

5.

1) ඔබ දන්නා ප්‍රස්ථාව පිරුළු 3ක් ලියා එහි තේරුමත් සඳහන් කරන්න.
2) "ප්‍රස්ථාව පිරුළු" යන්නෙහි අරුත කෙටියෙන් පැහැදිලි කරන්න.
3) "ලු" "සේ" "වාගේ" "ද" යන්නෙන් අවසන් වන පිරුළු එක බැගින් ලියන්න.
4) මේ පිරුළු වලින් ප්‍රකාශවන අදහස කුමක්ද?
   (අ) ඉත්තෑවාගේ බෙනේට කබල්ලෑවා වැදුනා වගේ
   (ආ) ගිය ලුලා මහ එකාලු
   (ඇ) වක්කඩේ හකුරු හැංගුවා වගේ
   (ඈ) හතර බීරි කථාව වගෙයි

6. පුන් මදාරා මල් දමින් .......

(අ) මේ කවියේ ඉතිරි කොටස සම්පූර්ණ කරන්න.
(ආ) එහි තේරුම ලියන්න.
(ඇ) මෙහිදී කවියා ඉදිරිපත් කරන්නේ මොන අගනන්ගේ රංගන විලාසයක්ද?
(ඈ) මෙහි සඳහන් මන්නදා, මිණි මෙවුල් යන පද වල තේරුම ලියන්න.

www.eduLanka.Lk



ඉස්කෝලේ edulanka.lk